(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 195.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 ජූනි මස 21 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1066/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එක් ගම්මානයක සාමාන්‍යයෙන් වාසය කරන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙරට ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙරට සිටින ප්‍රාදේශීය ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න මෑතකදී ලබාගත් ජනසංගණන සංඛ්‍යාලේඛන ආශ්‍රයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් පළාත, දිස්ත්‍රික්කය, මැතිවරණ කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටා ඇති ගම්මාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය කොපමණද;

(iii) මීළඟ නිල ජනසංගනනය පැවැත්වීමට නියමිතව ඇති දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1330/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ වර්ග මිලදීගැනීම සඳහා වර්ෂ 2011 ජනවාරි මස සිට මේ දක්වා කැඳවා ඇති ටෙන්ඩර් සංඛ්‍යාව කොපමණද;

(ii) ඖෂධ සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි රජයේ රෝහල්වල මේ වනවිට අත්‍යවශ්‍ය ඖෂධ වර්ගවල කිසියම් හිඟයක් ඇති වී තිබේද;

(ii) රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් ඇතිවීමට හේතු කවරේද;

(iii) හිඟයක් පවතින ඖෂධ වර්ග කවරේද;

(iv) මෙම තත්ත්වය මගහරවා රජයේ රෝහල්වලට හිඟයකින් තොරව ඖෂධ වර්ග ලබා දීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරන වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1917/'11

3\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් අතරින් "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති පාසල් කවරේද;

(ii) ක/වැව්ට මෛත්‍රී මහා විද්‍යාලය "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2041/'11

4\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතික මුද්‍රණය කිරීමේ ටෙන්ඩරය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කළ දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කළ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අවම මිල ගණන් ඉදිරිපත්කර තිබූ ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ටෙන්ඩර් කමිටුවේ සමාජිකයින්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් දරන තනතුර කවරේද;

(ii) මේ වනවිට ටෙන්ඩරය ලබා දී ඇති ආයතනය කවරේද;

(iii) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

(v) එම ටෙන්ඩරයේ වලංගු කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2237/'12

5\.

ගරු පී. හැරිසන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාහන දුම් පරීක්ෂාකිරීමේ ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(ii) එම පරීක්ෂණයේ ක්‍රියාපටිපාටිය කුමක්ද;

(iii) 2011 වර්ෂයේදී දුම් පරීක්ෂාව සිදු කළ වාහන සංඛ්‍යාව ඒ සඳහා එක් වාහනයකින් අය කළ මිල ගණන් එක් එක් වාහන වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2011 වර්ෂයේදී දුම් පරීක්ෂාවෙන් උපයා ගත් මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වාහන දුම් පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතියේ පෞද්ගලික ඒජන්තවරුන්ගේ හා මහජන ආයතනයන්ගේ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත පරීක්ෂණය සිදුකරනු ලබන පෞද්ගලික ඒජන්තවරුන් තෝරාගැනීම පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුව සිදු කළේද;

(iii) සමස්ත ආදායමින් එම ඒජන්තවරුන්ට මුදල් ගෙවනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම ඒජන්තවරුන්ගේ කළමනාකාරීත්ව දුර්වලතා හා දූෂණ සොයා බැලීමට නිසි පසු විපරම් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේද;

(v) එසේ නම්, මේ වන විට වාර්තාවී ඇති සිද්ධි හා ඊට අදාළව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත ව්‍යාපෘතියේ මූලික අරමුණු ළඟාකර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2250/’12

6.

ගරු තිස්ස අත්තනායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බාල පෙට්‍රල් භාවිතා කිරීම හේතුවෙන් හානි වූ වාහන පිළිබඳ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබූ කාල සීමාව සහ පැමිණිලි බාර ගැනීම අවසන් කළ දිනය කවරේද;

(iii) බාල පෙට්‍රල් භාවිතය හේතුවෙන් හානි වූ වාහන සඳහා වන්දි ගෙවීම ආරම්භ කළ දිනය කවරේද;

(iv) මේ වන විට වන්දි ගෙවා අවසන් කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(v) ඒ සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(vi) තවදුරටත් වන්දි ගෙවීම සඳහා ඉතිරි වී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(vii) ඒ සඳහා වැයවෙතැයි ගණන් බලා ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාල පෙට්‍රල් භාවිතය හේතුවෙන් හානිවූ වාහන සඳහා වන්දි ගෙවීම සහ බාල පෙට්‍රල් ගෙන්වීම සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ සමාජිකයින්ගේ නම්, තනතුරු සහ අදාළ වෙනත් සුදුසුකම් කවරේද;

(ii) ඔවුන් පත් කළ බලධාරියා කවුරුන්ද;

(iii) එම ත්‍රිපුද්ගල කමිටු වාර්තාව නිකුත් කර තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1817/'11

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මො/සි/කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලය ප්‍රධාන මාර්ගයේ සිට කිලෝ මීටර් 12ක් පමණ දුරින් පිහිටි දුෂ්කර පාසලක් බවත්;

(ii) ගොඩනැගිලි පහසුකම් නොලැබීම නිසා එම පාසලේ පංති කාමර තාවකාලිකව තනන ලද ටකරන් මඩුවල පවත්වා ගෙන යන බවත්;

(iii) එම තත්ත්වය සිසු දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ ජීවිතවලට අනතුරුදායක බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වය යටතේ එම පාසලේ ගුරුවරුන්ගේ හෝ සිසුන්ගේ ජීවිතවලට යම් හානියක් වුවහොත් එහි වගකීම දරනු ලබන අය කවුරුන්ද;

(ii) පවතින අයහපත් තත්ත්වය මගහැර මො/සි/කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලයේ පවතින ගොඩනැගිලි අඩුපාඩු සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) වෙන් කර ඇති මුදල කොපමණද;

(v) පාසල් ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1925/'11

8.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2008, 2009 සහ 2010 වර්ෂ තුළ ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වූ කාන්තාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වී ඇති කාන්තාවන් අතර සිටි මව්වරුන් පිළිබඳව සංඛ්‍යා ලේඛන විදේශ රැකියා නියුක්ති කාර්යංශය සතුව තිබේද;

(iii) එසේ නම්, ගෘහ සේවිකාවන් ලෙස විදේශගතවූ මව්වරුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය, අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මව්වරුන් විදේශගත වීම, ඔවුන්ගේ පවුල්වල දරුවන්ට අගතිදායක ලෙස බලපාන බවත්;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(12) ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේදී පවුල් ඒකක ආරක්ෂා කිරීම සඳහා රජය වෙත විශේෂ වගකීමක් පැවරී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, දරුවන් සිටින කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වීම නතර කිරීමට රජය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි පිරිවෙන් සංඛ්‍යාව හා ඒවායේ දැනට ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලා/ශිෂ්‍යයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලාට/ශිෂ්‍යයින්ට මාසිකව යම් ගෙවීමක් කරන්නේද;

(iii) එසේ නම්, එක් අයෙකු සඳහා ගෙවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් "මෙතෙක් පිරිවෙන් ශිෂ්‍යයන් සඳහා රජයෙන් ලබා දෙන ලද රුපියල් 1,000ක ප්‍රතිපාදනය රුපියල් 2,000 ක් දක්වා වැඩි කරන්නෙමි." යන පොරොන්දුව මේ වන විට ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ දිනය කවරේද;

(iii) ඒ යටතේ ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට එම පොරොන්දුව ක්‍රියාත්මක නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2238/'12

10.

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරුමැද පළාත් සභාව වකුගඩු රෝගීන්ට නොමිලයේ බෙදා හැරීම සඳහා ප්‍රමිතියෙන් තොර ජල පෙරණ අක්‍රමවත් ලෙස මිලදී ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම ජල පෙරණ මිලදී ගැනීමේදී,

(i) වැය කළ මුදල හා ලබා ගත් ජල පෙරණ සංඛ්‍යාව;

(ii) අනුගමනය කළ ටෙන්ඩර් පටිපාටිය;

(iii) ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතනවල නම්, ලිපිනයන් සහ ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන්;

(iv) ටෙන්ඩරය ලබාදුන් ආයතනයේ නම හා ලිපිනය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ජල පෙරණ,

(i) සම්බන්ධ ප්‍රමිති පරීක්ෂාව රජයේ ආයතනයකින් සිදු නොකර මිල දී ගත් ආයතනයෙන්ම සිදු කිරීමට අනුමතිය ලබා ගත් ක්‍රියා පටිපාටිය කවරේද;

(ii) බෙදාහැරීම නතර කරන ලෙස විගණකාධිපතිවරයා නියෝග කර තිබියදීත් තව දුරටත් ඒවා මිලදී ගන්නේද;

(iii) මිලදී ගැනීමට මුදල් අනුමත කළ නිලධාරියා කවුරුන්ද;

(iv) මිලදී ගැනීම රජයේ මුදල් රෙගුලාසිවලට පටහැනිව සිදුකර ඇති බව පිළිගන්නේද;

(v) මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2252/'12

11.

ගරු තිස්ස අත්තනායක මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය කඩදාසි කම්හල අවසන් වරට වසා දමනු ලැබූ දිනය කවරේද;

(ii) ඒ වනවිට එම ආයතනයේ සේවය කරනු ලැබූ ස්ථිර හා අනියම් සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) වසා දැමූ එම කම්හලේ සේවකයන් සඳහා තවමත් වැටුප් ගෙවීම සිදු කරන්නේද;

(iv) ඒ සඳහා මාසයකට වැය කරන මුළු මුදල කොපමණද;

(v) වසා දැමූ දිනයේ සිට 2011 සැප්තැම්බර් මාසය දක්වා සේවක වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(vi) සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතුව ඇති හිඟ සේවක වන්දි, අර්ථ සාධක අරමුදල් හා සේවක පාරිතෝෂික මුදල්වල මුළු වටිනාකම කොපමණද;

(vii) එම මුදල් ගෙවීමට කටයුතු කරන්නේද;

(viii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලි බල මණ්ඩලයට ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙන් ගෙවිය යුතු මුළු ණය මුදලේ වටිනාකම කොපමණද;

(ii) එම ණය මුදල් පියවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1818/'11

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කොටබෝව මාර්ගයේ එකේ කණුව ප්‍රදේශයේ ඉදිකර ඇති වී අලෙවි මණ්ඩලයට අයත් විශාල ප්‍රමාණයේ වී ගබඩාවක් වර්ෂ විස්සක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා ඇති බවත්;

(ii) එම ගබඩාව නැවතත් ප්‍රතිසංස්කරණය කර වී ගබඩා කිරීම සඳහා යොදා ගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත ගබඩාව ප්‍රතිසංස්කරණය කරන්නේ නම්, ඊට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) නොඑසේ නම්, වෙනත් කර්මාන්තයක් හෝ මෙහි ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2061/'11

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමික රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් වෙනුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ප්‍රතිලාභ ලැබිය හැකි රක්ෂණ ක්‍රම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 මහින්ද චින්තනයේ සඳහන් "විශ්‍රාමික රජයේ සේවකයින්ට සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ඖෂධ සහ වෛද්‍ය ගාස්තු සඳහා වර්ෂයකට රුපියල් 10,000/- ක් වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි." යන පොරොන්දුවට අනුව හඳුන්වා දී ඇති රක්ෂණ ක්‍රමය කවරේද;

(ii) ඒ යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ඇති විශ්‍රාමික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ප්‍රතිලාභ ලබා ඇති විශ්‍රාමික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති මුදල කොපමණද;

(v) නොඑසේ නම්, එම රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා දීම ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*4.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— “2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*8.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**